# පුරප්පාඩු දැන්වීමයි

## මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### මධ්‍යම පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ

### පළාත් ආයුර්වේද කොමසාරිස් තනතුර සඳහා බඳවා ගැනීම

මධ්‍යම පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ඉදිරියේදී පුරප්පාඩු වීමට නියමිත පළාත් ආයුර්වේද කොමසාරිස් තනතුර සඳහා පත්කිරීමට දැනට රාජ්‍ය සේවයෙහි හා පළාත් රාජ්‍ය සේවයෙහි සේවයේ නියුතු ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ පරිපාලන I ශ්‍රේණියේ නිලධාරීන් වෙතින් අයැදුම්පත් කැඳවනු ලැබේ.

**01.** **සුදුසුකම්**

I. ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ පරිපාලන I ශ්‍රේණියේ නිලධාරියෙකු වීම.

II. දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධරයන් වෙතින් පමණක් අයැදුම්පත් කැඳවන බැවින් වයස් සීමාවක් අදාල නොවේ.

III. අයැදුම්පත් භාර ගන්නා අවසන් දින වන විට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුයි.

IV. අයැදුම්පත් කැඳවීමේ අවසන් දිනට පූර්වාසන්න පස් වසරක කාල සීමාවක් තුළ විනය කටයුත්තකට හෝ විනය දඬුවමකට භාජනය නොවූ අයෙකු විය යුතුය.

**02.** **තෝරා ගැනීමේ ක්‍රමය**

මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් දීප ව්‍යාප්තව අයැදුම්පත් කැඳවා සුදුසුකම් සම්පූර්ණ කරන ලද නිලධාරීන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර ජ්‍යෝෂ්ඨතාවය හා කුසලතාවය අනුව ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයා පත්කරනු ලැබේ.
( අදාල සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සඳහා දේශීය වෛද්‍ය විෂය භාර රේඛීය අමාත්‍යාංශයේ නියෝජිතයෙකුද ඇතුළත් කර ගැනීමට කටයුතු කරනු ලැබේ.)
(අනුමත ලකුණු නිර්ණායක www.psc.cp.gov.lk යන වෙබ් අඩවියෙහි පළකර ඇත)

සටහන: සුදුසුකම් සනාථ කෙරෙන සියලුම සහතිකවල සහතික කරන ලද ඡායා පිටපත්, ජාතික හැඳුනුම්පතේ හා උප්පැන්න සහතිකයේ සහතික කරන ලද ඡායා පිටපත් අයැදුම්පත සමඟ අමුණා එවිය යුතුය.

**03.** **අයැදුම්පත් ඉදිරිපත් කිරීම**

සියලුම අයැදුම්පත් විධිමත්ව හා නිවැරදිව සම්පූර්ණ කර 2022.12.28 වන දින හෝ ඊට පෙර ලැබෙන ලෙස දෙපාර්තමේන්තු ප්‍රධානියා සහ අදාළ අමාත්‍යාංශ ලේකම් මගින් (පළාත් සභාවට අන්තර්ග්‍රහණය වූ නිලධරයෙකු නම් ඔබගේ අයැදුම්පත පළාත් අමාත්‍යාංශ ලේකම් හා ප්‍රධාන ලේකම් ගේ නිර්දේශ සහිතව යොමු කළ යුතුය) **" ලේකම්, මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 244, කටුගස්තොට පාර, මහනුවර "** යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයැදුම්පත බහාලන ලිපි කවරයේ වම්පස ඉහළ කෙලවරේ **"මධ්‍යම පළාත් ආයුර්වේද කොමසාරිස් තනතුර සඳහා අයැදුම්පත් කැඳවීම"** යනුවෙන් සඳහන් කළ යුතුය. නියමිත දිනට පසු ලැබෙන අයැදුම්පත්, අසම්පූර්ණ අයැදුම්පත් සහ අයැදුම්පත් කැඳවීමේ අවසන් දිනට නියමිත සුදුසුකම් සපුරා නොමැති අයැදුම්කරුවන්ගේ අයැදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයැදුම්පත් ප්‍රමාද වීම හෝ නැති වීම පිළිබඳ කිසිදු පැමිණිල්ලක් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව භාර ගනු නොලැබේ. (ආදර්ශ අයැදුම්පත්‍ර www.psc.cp.gov.lk යන වෙබ් අඩවියෙන් බාගත කර ගත හැකිය)

04. 2020.10.27 දිනැති අංක 2199/10 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ වූ ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ කොන්දේසි මෙම බඳවා ගැනීම සඳහා බල පවත්වනු ලැබේ.

05. මෙම බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙහි විධිවිධාන සලසා නොමැති කරුණු පිළිබඳ තීරණ ගැනීමේ බලය මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

06. මෙම දැන්වීමේ සිංහල ,දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර, යම් පරස්පරතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේය.

මෙයට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

2022 දෙසැම්බර් මස 14 වැනි දින.
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේදීය

ටී.ඒ.ඩී.ඩබ්ලිව්.දයානන්ද,
ලේකම්,
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**<u>මධ්‍යම පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ පළාත් ආයුර්වේද කොමසාරිස් තනතුරට බඳවා ගැනීමේ</u>**

**<u>සම්මුඛ පරීක්ෂණයේ ලකුණු නිර්ණායක</u>**

<table>
<tr><th></th><th>ලකුණු ලබා දෙනු ලබන ක්ෂේත්‍රයන්</th><th>උපරිම ලකුණු ප්‍රමාණය</th></tr>
<tr><td>01.<br>ජ්‍යෙෂ්ඨතාවය<br>ලකුණු 60</td><td>1.1 ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ පරිපාලන 1 ශ්‍රේණියේ සක්‍රීය සේවා කාලය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2019 හි විධිවිධාන අනුව ලකුණු ලබා දෙනු ලැබේ.<br>(වසරකට ලකුණු 05 බැගින්)</td><td>60</td></tr>
<tr><td rowspan="6">02.<br>කුසලතාවය<br>ලකුණු 40</td><td><u>02.1 අධ්‍යාපන සුදුසුකම් (ආයුර්වේද විෂය ක්ෂේත්‍රය)</u><br><br>(උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ)<table><tr><td>දර්ශනශූරී උපාධි (PhD)</td><td>ලකුණු 09</td></tr><tr><td>දර්ශනපති උපාධි ( M Phil)</td><td>ලකුණු 08</td></tr><tr><td>පශ්චාත් උපාධි</td><td>ලකුණු 07</td></tr><tr><td>පශ්චාත් උපාධි ඩිප්ලෝමා</td><td>ලකුණු 06</td></tr></table><br>අධි ශ්‍රේණියට උසස් කිරීමේදී සලකා නොබැලූ පශ්චාත් උපාධි ඩිප්ලෝමා හා ඊට ඉහල අධ්‍යාපන සුදුසුකම් සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.</td><td>09</td></tr>
<tr><td><u>02.2 ක්ෂේත්‍රයට ආදාල පළපුරුද්ද</u><br><br>ආයුර්වේද වෛද්‍ය සේවයේ නිලධාරියෙකු ලෙස පරිපාලන කටයුතු හා සම්බන්ධ තනතුරක සේවා පළපුරුද්ද<br>(වසරකට ලකුණු 01 බැගින් වසර 05ක් සඳහා උපරිම ලකුණු 05)</td><td>05</td></tr>
<tr><td><u>02.3 ආයතනික පරිපාලන විෂයය ක්ෂේත්‍රයට සම්බන්ධ පුහුණු පාඨමාලා</u><br><br>පරිපාලන විෂය ක්ෂේත්‍රය සම්බන්ධ පුහුණු පාඨමාලා<br><br>(පුහුණු පාඨමාලාවේ කාලය සති 02කට වඩා වැඩි විය යුතුය. එක් පාඨමාලාවකට ලකුණු 1 බැගින් උපරිම ලකුණු 02)</td><td>02</td></tr>
<tr><td><u>02.4 කාර්යය සාධන ඇගයුම්</u><br>අයැදුම්පත් කැඳවීමේ අවසන් දිනට පූර්වයෙන් වූ වසර පහක (05) කාල සීමාව තුළ වාර්ෂික කාර්ය සාධන ඇගයීම්වලින් ලබාගත් ශ්‍රේණිගත කිරීම් භාවිත කරමින් ලකුණු ප්‍රදානය කෙරේ.<table><tr><td>විශිෂ්ටයි</td><td>ලකුණු 03</td></tr><tr><td>සාමාන්‍යයට වඩා ඉහළින්</td><td>ලකුණු 02</td></tr><tr><td>සතුටුදායකයි</td><td>ලකුණු 01</td></tr></table></td><td>15</td></tr>
<tr><td><u>02.5 වෙනත් සුදුසුකම්</u><br>I. පළාත් , ජාතික , අන්තර්ජාතිකව ක්ෂේත්‍රයට අදාලව ලබා ගත් සුවිශේෂී ජයග්‍රහණ<br>II. ප්‍රශංසා ලිපි (පොදු 230 බී ආකෘතියේ)<br>III. ප්‍රකාශයට පත්කර ඇති පර්යේෂණ පත්‍රිකා හෝ කෘතීන්<br>( ඉහත එක් එක් අවස්ථාව අතුරින් ඕනෑම අවස්ථාවක් සඳහා එක් අවස්ථාවකට ලකුණු 01 බැගින් උපරිම අවස්ථා 04ක් සඳහා, මේ සඳහා අදාළ වන ලේඛණ ඉදිරිපත් කළ යුතු අතර, ආයතන ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය)</td><td>04</td></tr>
<tr><td><u>02.6 සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන නිපුණතාවය</u><table><tr><td>නායකත්වය</td><td>ලකුණු 02</td></tr><tr><td>සන්නිවේදන හැකියාව</td><td>ලකුණු 02</td></tr><tr><td>පෞරුෂත්වය</td><td>ලකුණු 01</td></tr></table></td><td>05</td></tr>
<tr><td></td><td>මුළු ලකුණු</td><td>100</td></tr>
</table>